රුහුණ විශ්වවිද්‍යාලය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව - 2019/2020 අධ්‍යයන වර්ෂය

පළමු සමාසික අවසාන පරීක්ෂණය - 2020 සැප්තැම්බර්

# MAE 5103 - ශ්‍රී ලංකාවේ ආර්ථිකය

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. එක් කොටසකින් ප්‍රශ්න දෙක **(02)** බැගින් තෝරාගෙන ප්‍රශ්න <u>හතරකට **(04)**</u> පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03 යි.

---

## <u>I කොටස</u>

01. (i) වර්ෂ 1948 -1977 කාල පරාසයෙහි ශ්‍රී ලංකා ආර්ථිකය ව්‍යුහාත්මක වෙනස්කම් සහ ගුණාත්මක වශයෙන් පරිවර්තනයක් සනිටුහන් කළෙහි ද? මෙම ප්‍රකාශය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ii) "වර්ෂ 1977 - 2020 කාල පරාසය ශ්‍රී ලංකා ආර්ථිකය ගෝලීයකරණයෙහි උපරිම ප්‍රතිඵල ලබා ගැනීමේ අරමුණින් ලිබරල්වාදී ප්‍රතිපත්ති හා වෙළෙඳපොළ ආර්ථිකයක් කරා ගමන් කිරීමක් දැක ගත හැක." සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

02. ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කාෂිකාර්මික, ක්ෂේත්‍රයෙහි 'ආහාර සුරක්ෂිතතාවය' හා දේශීය සමෘද්ධිමත්භාවය ඇතිකරලීම උදෙසා පවතින අභියෝග හා එම අභියෝග ජයගැනීමට ක්‍රියාත්මක කිරීමෙහිලා ගත හැකි උපායමාර්ගික ප්‍රතිපත්ති පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

03. (i) "ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය විශිෂ්ට ජයග්‍රහණ රැසක් අත්පත් කරගත් අතර එය ජනවිකාශනයේ ධනාත්මක වෙනස්කම්වලට බලපෑම් කොට තිබුණත් එමගින් පිරමීඩය තුළ වයස්ගත ජනගහනය වැඩිවීම තුළින් අසමතුලිත බවක් ද ඇති විය." සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

(ii) ශ්‍රී ලංකා ආර්ථිකය තුළ පවතින "හැකියා හිඩැස" පිරවීමට ශ්‍රම වෙළෙඳපොළ තුළ සිදු කළ යුතු ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

## II කොටස

04. (i) ශ්‍රී ලංකා දරිද්‍රතාවයේ සහ ආදායම් ව්‍යාප්තියේ මෑතකාලීන උපනතීන් හඳුනාගන්න.

(ලකුණු 04)

(ii) ශ්‍රී ලංකා දරිද්‍රතා ගැටළුවේ කැපී පෙනෙන ලක්‍ෂණ කවරේ ද?

(ලකුණු 04)

(iii) "සංවර්ධනය වන රටවල් අතර ශ්‍රී ලංකාව ප්‍රමාණවත් ආර්ථික වර්ධනයකින් තොරව ඉහළ මානව සංවර්ධන මට්ටමක් ලබාගෙන ඇත." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟවන්නේ ද?

(ලකුණු 07)

05. (i) "සමස්ථ සාධක ඵලදායිතාව" යන්නෙන් කුමක් අදහස් වේ ද?

(ලකුණු 04)

(ii) රටක ආර්ථික වෘද්ධිය සහ සේවා නියුක්තිය ඉහළ දමා ගැනීම සම්බන්ධයෙන් ඵලදායිතාව වැදගත්වන්නා වූ ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 05)

(ii) ඵලදායිතාව ඉහළ දමාගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග කවරේ ද?

(ලකුණු 06)

06. විස්තරාත්මක සටහන් ලියන්න.

(i) මෑතකාලීන. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සංවර්ධන සහකරුවන්ගේ කාර්යභාරයේ උපනතීන්
(ii) විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනය
(iii) බහුමානීය දරිද්‍රතා දර්ශකය

(ලකුණු 5 x 3 = 15)

@@@@@@@@